# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශේෂ**

**අංක 2299/09 - 2022 සැප්තැම්බර් මස 27 වැනි අඟහරුවාදා - 2022.09.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය*: MTR/LND/ACQUI/L01/4001.
*ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය*: 4-3/12/2008/WS/280.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවින්, 1994 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 428A රුවන්ඇල්ල වසමේ හිරිදෙනිකන්ද ගමේ පිහිටි මු. පි. මාර 2889 මූලික පිඹුරේ කැබලි අංක 01 වශයෙන් දැක්වෙන පහත සඳහන් ඉඩම මාතර-මිරිස්ස ජල සම්පාදන ක්‍රමය වැඩි දියුණු කිරීම සඳහා මාළිගාතැන්න පැරණි ජල ටැංකිය වෙනුවට ජල ටැංකියක් ඉදිකිරීම සඳහා ඉඩම් අත්කර ගනු ලැබේ.

**උපලේඛනය**

**කැබලි අංක 01**

ඉඩමේ නම: මාළිගාතැන්න; ඉඩමේ විස්තරය: ගෙවත්ත, වතුර ටැංකියක් ඇත; හිමිකම් කියන අය: ඉලන්දාරිගේ අන්ද්‍රයස්; ප්‍රමාණය: හෙක්ටයාර්: 0.0051

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 නොවැම්බර් මස 25 වන දින පෙ. ව. 10.30ට මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය. තවද නොවැම්බර් මස 04 වන දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශ්‍යතාව ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

කේ. එන්. කෞශල්‍යා කුමාරි,
ප්‍රාදේශීය ලේකම්,
මාතර.

2022 සැප්තැම්බර් මස 22 වැනි දින,
මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 09 - 0290

## ශුද්ධිපත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය*: 7/3/1/13/රුසිගම කෙන්ටිවත්ත/අත් 11.

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/15/2015/VE/204.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 7 වැනි වගන්තිය යටතේ දැන්වීම මා විසින් පළකල අංක 2266/54 හා 2022 පෙබරවාරි මස 10 වන දින ගැසට් පත්‍රයේ සඳහන් හිමිකම් පරීක්ෂණය හා වන්දි පරීක්ෂණය දිනය හා වේලාව වෙනුවට 2022 දෙසැම්බර් මස 21 වන දින පෙ. ව. 10.00 ලෙස සංශෝධනය කරන බව මෙයින් දැනුම් දෙමි.

එච් එම්. සී. ඒකනායක,
ප්‍රාදේශීය ලේකම්.

2022 සැප්තැම්බර් මස 20 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
පල්ලේපොල.

EOG 09 - 0291